# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2003 අංක 14 දරන භාණ්ඩ හා සේවා (පාලනය සහ නඩත්තුව) (තාවකාලික විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 23 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 මාර්තු මස 28 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.50 යි. තැපැල් ගාස්තුව : රු. 4.50 යි.

# 2003 අංක 14 දරන භාණ්ඩ හා සේවා (පාලනය සහ නඩත්තුව) (තාවකාලික විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2003 මාර්තු මස 23 වන දින]

එල් ඩී.—ඕ. 20/2003.

**ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශයෙන් පිටත යුධ සටන් ඇරඹීම හේතුකොටගෙන, පැන නැඟීමට ඉඩ ඇති භාණ්ඩ හිඟය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ක්‍රමෝපායයන් සකස් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ජනජීවිතයට අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයුම සහතික කිරීම පිණිස ද ; එවැනි භාණ්ඩ, සාධාරණ මිලකට සමාන ලෙස බෙදා හැරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ; ජනජීවිතයට අත්‍යවශ්‍ය උපයෝගී සේවා නඩත්තු කිරීම සහතිකවීම පිණිස සහ එම සේවාවල මිල පාලනය කිරීම සඳහා ද ; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

නුදුරු අනාගතයේ දී ඇතැම් ජාතීන් අතර යුධ සටන් ආරම්භවීමේ අවකාශයක් ඇති බැවින් ද : පූර්විකාව.

යුධ සටන් ඇරඹීම හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ ජනජීවිතයට අත්‍යවශ්‍ය යම් භාණ්ඩ සැපයුමක හිඟයක් ඇති විය හැකි බැවින් නැතහොත් එවැනි භාණ්ඩ බෙදාහැරීම අඩාළවීමට ඉඩ ඇති බැවින් ද සහ එමගින් එම භාණ්ඩවල හිඟයක් ඇතිවීමට ඉඩ ඇති හෙයින් නැතහොත් ජනජීවිතයට අත්‍යවශ්‍ය උපයෝගී සේවා නඩත්තු කිරීමට බාධා ඇති විය හැකි බැවින් ද :

ජනජීවිතයට අත්‍යවශ්‍ය විධිමත් භාණ්ඩ සැපයුමක් තිබීම සහතික කිරීම සඳහා අවශ්‍ය බලතල ආණ්ඩුව වෙත පැවරීම සඳහා සහ පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට එම භාණ්ඩ සාධාරණ ලෙස බෙදාදීම සහතික කිරීම සඳහාත් ජනජීවිතයට අවශ්‍ය උපයෝගී සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම සහ එම සේවාවල මිල පාලනය විධිමත් කිරීම සඳහාත් අවශ්‍ය බව පෙනී යන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. (1) මේ පනත 2003 අංක 14 දරන භාණ්ඩ හා සේවා (පාලනය සහ නඩත්තුව) (තාවකාලික විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලය විමසා ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් කලින් — ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

කල, වරකට එක් මාසයකට වැඩි නොවිය යුතු කාල සීමාවක් සඳහා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. කෙසේ වුවද, පනත ක්‍රියාත්මක වීමේ මුළු කාලසීමාවේ එකතුව මාස තුනක් නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමේ දී අමාත්‍යවරයා විසින් පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතු ය :-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සන්නද්ධ අරගල දිගටම පැවතීමේ හැකියාව ;

(ආ) ජන ජීවිතයට අත්‍යවශ්‍ය යම් භාණ්ඩ බෙදාහැරීමේ දී අඩාල වීම සහ එමගින් එම භාණ්ඩයේ හිඟයක් ඇතිවීමට ඉඩකඩ තිබීම ;

(ඇ) ජන ජීවිතයට අත්‍යවශ්‍ය උපයෝගී සේවා නඩත්තු කිරීමට යම් බාධාවක් ඇතිවීමේ හැකියාව ; සහ

(ඈ) එවැනි භාණ්ඩවල විධිමත් සැපයුමක් තිබීම සහතික කිරීම සහ එවැනි උපයෝගී සේවා අඛණ්ඩව පවත්වාගෙන යාම.

(3) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියමයක් ඒ නියමය කළ වහාම අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. කෙසේ වුවද, එම කාලය ඇතුළත පාර්ලිමේන්තුව රැස් නොවන්නේ නම් එම නියමය අනුමතය සඳහා පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීම් දිනයේදී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ඉහත දක්වා ඇති මාස තුනක කාලසීමාව අවසන් වීමට පෙර, තවදුරටත් වූ කාලසීමාවක් සඳහා පනත ක්‍රියාත්මක වීමේ කාලය දීර්ඝ කිරීම අවශ්‍ය බව පාර්ලිමේන්තුවේ මතය වන අවස්ථාවක, පාර්ලිමේන්තුව විසින් යෝජනා සම්මතයක් මගින් වරකට එක් මාසයකට නොවැඩි කාලයක් සඳහා පනත ක්‍රියාත්මකවීමේ කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකි ය.

නිසි බලධරයකු පත් කිරීම හා මහුගේ කර්තව්‍ය ආදිය.

**2.** (1) මේ පනතේ කාර්ය සඳහා අමාත්‍යවරයා විසින් යම් තැනැත්තකු නිසි බලධරයා ලෙස, නමින් හෝ ධුරයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා තමාට සහායවීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් හා සේවකයන් නිසි බලධරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) නිසි බලධරයා විසින් පහත සඳහන් බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම කළ යුතු ය :-

(අ) 5 වන වගන්තිය යටතේ නියමයක් සාදනු ලැබ ඇත්තේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද එම භාණ්ඩය ගබඩා කර ඇති යම් පරිශ්‍රයකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම ;

(ආ) 5 වන වගන්තිය ප්‍රකාරව කර ඇති සියලු නියමයන් ක්‍රියාත්මක කරන බවට සහතික වීම ;

(ඇ) 5 වන වගන්තිය යටතේ කරන ලද නියමයන් ප්‍රකාරව විධිවිධාන සලසා ඇති පාලන ක්‍රමයක් පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඈ) මිල දී ගෙන ඇති යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු, ලබා ගැනීමට සහ බෙදා හැරීමට අදාළ කාර්ය පටිපාටිය සකස් කිරීම ;

(4) (3) වන උපවගන්තියේ (අ) ඡේදය මගින් තමා වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට පෙර නිසි බලධරයා විසින් එකී පරිශ්‍රය පිහිටි ප්‍රදේශය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගේ තත්කාර්ය සඳහා වරෙන්තුවක් ලබා ගත යුතු ය.

(5) නිසි බලධරයාට සහ (2) වන උපවගන්තිය යටතේ පත් කරනු ලබන නිලධරයන්ට හා සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා කරන ලද නියමයක් මගින් තීරණය කළ යුතු ය. ඒ පාරිශ්‍රමිකය ඒකාබද්ධ අරමුදලින් අයකර ගනු ලැබිය යුතු ය.

(6) නිසි බලධරයා සහ මේ වගන්තිය ප්‍රකාරව පත් කරනු ලබන නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ කාර්ය සඳහා සහ එහි අර්ථානුකූලව රජයේ නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අමාත්‍යවරයා විසින් විධාන කළ හැකි බව.

**3.** පනත මගින් නිසි බලධරයාට පවරා ඇති කර්තව්‍යවලින් ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි අමාත්‍යවරයාට පෙනී යන සාමාන්‍ය හෝ විශේෂ විධාන අමාත්‍යවරයා විසින් කලින් කල නිසි බලධරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඒ විධානවලට අනුකූලව ක්‍රියා කිරීම නිසි බලධරයාගේ කාර්ය විය යුතු ය.

උපදේශක කමිටුව.

**4.** (1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) උපදේශක කමිටුවක් තිබිය යුතු අතර එහි කර්තව්‍ය විය යුත්තේ පනත ප්‍රකාරව අමාත්‍යවරයාගේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා අමාත්‍යවරයාට උපදෙස් දීම වේ.

(2) කමිටුව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :-

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා, සභාපතිවරයා විය යුත්තේ ය ;

(ආ) වෙළෙඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඇ) සමුපකාර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ඈ) නිසි බලධරයා ;

(ඉ) ප්‍රතිපත්ති සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ;

(ඊ) වෙළෙඳ සංගමය මගින් නම් කරනු ලබන එම සංගමයේ නියෝජිතයෙක්.

(3) කමිටුව විසින් පහත දැක්වෙන කර්තව්‍ය ඉටු කළ යුතු ය :-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත සන්නද්ධ අරගලයක් ආරම්භවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජන ජීවිතයට අත්‍යවශ්‍ය යම් භාණ්ඩයක් සැපයීමේ දී හිඟයක් ඇතිවීමට ඉඩ ඇති බව පිළිබඳව හෝ එම භාණ්ඩ බෙදා හැරීමේ දී යම් කඩාකප්පල් වීමක් සිදු විය හැකි බවට හෝ ජන ජීවිතයට අත්‍යවශ්‍ය උපයෝගී සේවා නඩත්තු කිරීමේ යම් බාධාවීමක් සිදු විය හැකි බවට අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ආ) භාණ්ඩ විකිණීමට අදාළව-

(i) යම් භාණ්ඩයක් නොවිකිණිය යුත්තේ යම් උපරිම තොග මිලකට හෝ සිල්ලර මිලකට වැඩියෙන් ද, ඒ මිල පිළිබඳව ;

(ii) එම තොග මිල හෝ සිල්ලර මිල නියම කළ යුත්තේ යම් මිල දර්ශකයකට අනුකූලව ද එම මිල දර්ශකය පිළිබඳව ;

(iii) අනුගමනය කළ යුතු භාණ්ඩ සැපයීම සීමා කිරීමේ ක්‍රමය පිළිබඳව ;

(iv) අනුගමනය කළ යුතු භාණ්ඩ මිල දී ගැනීමේ ක්‍රමය පිළිබඳව ;

(v) හැකිතාක් ඉක්මනින් සාමාන්‍ය වෙළෙඳපොල බලවේග සහ බෙදා හැරීමේ ක්‍රම ක්‍රියාත්මක වන බවට සහතික වීම පිණිස ගත යුතු අවශ්‍ය පියවර පිළිබඳව,

අමාත්‍යවරයාට උපදෙස් දීම ;

(ඇ) උපයෝගි සේවා සැලසීමට අදාළව-

(i) යම් මහජන උපයෝගී සේවා සැපයීම සඳහා උපරිම මිලක් නියම කිරීම පිළිබඳව :

(ii) උපරිම මිල නියම කළ යුත්තේ යම් මිල දර්ශකයකට අනුකූලව ද ඒ මිල දර්ශකය සකස් කිරීමේ දී භාවිත කරනු ලබන සූත්‍රය පිළිබඳව,

අමාත්‍යවරයාට උපදෙස් දීම.

**5.** (1) ශ්‍රී ලංකාවෙන් පිටත ඇතැම් ජාතීන් අතර යුධ සටනක් ආරම්භවීමේ ප්‍රතිඵලයක් වශයෙන්, යම් භාණ්ඩවල හෝ යම් සේවාවල හිඟයක් ශ්‍රී ලංකාව තුළ ඇති බවට හෝ ඇතිවීමට ඉඩ ඇති බවට අමාත්‍යවරයාට පෙනී යන අවස්ථාවක කමිටුවේ උපදේශය මත, යම් භාණ්ඩ බෙදා හැරීමේ හෝ භාණ්ඩ තිබීමේ

හදිසිසේවා නියමයන්.

නැතහොත් , යම් මහජන උපයෝගි සේවාවක් සැපයීමේ කඩාකප්පල්වීමක් සිදු නොවන බවට සහතික වීම පිණිස අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව (මෙහි මින් මතු ''නියමය'' යනුවෙන් සඳහන් කරනු ලබන) හදිසි සේවා නියමය නම් වූ නියමයක් ගැසට් පත්‍රයේ පළ කිරීම මගින් -

(අ) නියමයක් කරනු ලැබ ඇති භාණ්ඩයක් විකිණිම නොකළ යුත්තේ යම් උපරිම තොග මිලකට හෝ සිල්ලර මිලකට ඉහළින් ද ඒ තොග මිල හෝ සිල්ලර මිල නියම කළ හැකි ය ; හෝ

(ආ) නියමයක් කරනු ලැබ ඇති භාණ්ඩයක උපරිම මිල නියම කළ යුත්තේ යම් මිල දර්ශකයකට අනුකූලව ද ඒ මිල දර්ශකය නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය ; හෝ

(ඇ) නියමයක් කරනු ලැබ ඇති භාණ්ඩයක් විකුණනු ලැබිය හැකිවනුයේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසිය ද එම භාණ්ඩය විකුණනු ලැබිය හැකි වේලාව සහ ස්ථානය ද එසේම විකිණිය හැකි ප්‍රමාණය ද නිශ්චිතව දක්වනු ලැබිය හැකිය ; හෝ

(ඈ) නියමයක් කරනු ලැබ ඇති යම් භාණ්ඩයක්, බෙදහරින්නන් හෝ වෙළෙන්දන් වෙත ලබා දීම සඳහා විධිවිධාන සැලසීම ; හෝ

(ඉ) නියමයක් කරනු ලැබිය හැකි භාණ්ඩයක් මහජනයා වෙත ලබාදීමේ දී යටත් විය යුතු සීමා කිරීමේ ක්‍රමය සංවිධානය කිරීම හෝ පරිපාලනය කිරීම සඳහා විධිවිධාන සැලසීම ; හෝ

(ඊ) නියමයක් කරනු ලැබ ඇත්තේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩය ප්‍රවාහනය කිරීම සහ රැගෙනයාම සඳහා විධිවිධාන සැලසීම ; හෝ

(උ) නියමයක් කරනු ලැබ ඇති යම් සේවාවක් සලසනු ලැබිය යුත්තේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි (වෙන් වෙන් සේවා පිළිබඳ විශේෂ සඳහන් කිරීමක් සහිතව) නිශ්චිතව දැක්වීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම අමාත්‍යවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ සුළු වශයෙන් වෙනස් කිරීම කළ හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක් ම එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට හෝ ඒ නියමයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියමයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට සති දෙකක් ඇතුළත ඒ නියමය අනුමත කළ යුතු බවට වූ මෝසමක් ද සහිතව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එම කාල සීමාව තුළ පාර්ලිමේන්තුව රැස් නොවන්නේ නම් පාර්ලිමේන්තුවේ ඊළඟ රැස්වීම් දිනයේ දී එම නියමය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලබන යම් නියමයක් එම අනනුමතයේ දින සිට බලපවත්වන පරිදි අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(6) යම් නියමයක් එසේ අවලංගු කරනු ලැබූ දිනය පිළිබඳව නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

භාණ්ඩ මිල දී ගැනීම.

6. (1) 5 වන වගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇත්තේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද එම භාණ්ඩය සාධාරණ ලෙස බෙදාහැරීම සහතික වීම පිණිස සුදුසු හෝ අවශ්‍ය යයි නිසි බලධරයාට පෙනී යන්නේ නම්, ඒ කාර්ය සඳහා ලබාගත හැකි හෝ අවශ්‍ය වන එම භාණ්ඩයේ යම් ප්‍රමාණයක් මිලදී ගැනීම සඳහා නිසි බලධරයා විසින් නියමයක් කළ හැකි ය. 5 වන වගන්තිය යටතේ ඒ භාණ්ඩය සඳහා නියම කර ඇති තොග මිල ප්‍රකාරව ඒ භාණ්ඩය මිල දී ගැනීම සඳහා සහ ඒ මිල දී ගැනීම සම්බන්ධයෙන් මුදල් ගෙවීම සඳහා අමාත්‍යවරයා විසින් විධාන නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයකට–

(අ) මිල දී ගැනීමට ඇති භාණ්ඩ තොගය සහ නියමිත ප්‍රමාණය ඇත්තේ යම් තැනැත්තකුගේ සන්තකයේ ද එම තැනැත්තාගේ නම සහ ලිපිනය ;

(ආ) නියමය ප්‍රකාරව මිල දී ගන්නා ලද භාණ්ඩ තොගය එම තැනැත්තා විසින් භාර දිය යුතු වේලාව සහ ස්ථානය

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය ප්‍රකාරව, නිසි බලධරයා විසින් මිල දී ගැනීමේ නියමයක් කර ඇත්තේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද, ඒ භාණ්ඩ නිසි බලධරයාට විකිණීම යම් තැනැත්තකු විසින් ප්‍රතික්ෂේප කරන විට, නිසි බලධරයාට එම භාණ්ඩයේ අවශ්‍ය ප්‍රමාණය විකුණන ලෙස එම තැනැත්තාට බලකරන ආඥාවක්, එම භාණ්ඩය ගබඩා කර ඇති ස්ථානය පිළිබඳ අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයාගෙන් නිසි බලධරයාට ලබාගත හැකි ය.

වැරදි.

7. (1) (අ) මේ පනත ප්‍රකාරව සිය බලතල ක්‍රියාත්මක කරන හෝ සිය කර්තව්‍ය ඉටු කරන නිසි බලධරයාට, ඔහුගේ නිලධරයන්ට හෝ සේවකයන්ට ප්‍රතිරෝධය පාන හෝ බාධාකරන ; හෝ

(ආ) 5 වන වගන්තිය යටතේ නියමයකට විෂය වූ යම් භාණ්ඩයක් 5 වන වගන්තියේ (අ) ඡේදය ප්‍රකාරව, එම භාණ්ඩය විකිණීම සඳහා නියම කර ඇති මිලට වැඩියෙන් විකුණන ; හෝ

(ඇ) සඳහන් කර ඇති යම් තොරතුරු අසත්‍ය වන ප්‍රකාශයක් දැන දැනම ඉදිරිපත් කරන,

යම් තැනැත්තෙක් වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, අවුරුදු පහකට නොඅඩු කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්ලක්ෂයකට නොඅඩු දඩයකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

(2) මේ පනත යටතේ යම් වරදකට තැනැත්තකු වරදකරු කරනු ලැබීමේ දී, වරද සිදුකරනු ලැබුවේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ භාණ්ඩ රාජ සන්තක කරන ලෙස අධිකරණය විසින් ආඥා කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ රාජ සන්තක කරන ලද යම් භාණ්ඩයක් —

(අ) රාජ සන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කරනු නොලැබුවේ නම්, අභියාචනයක් ඉදිරිපත් කළ හැකි කාලසීමාව අවසානයේ දී, යම් උකසකින්, ඔඩපනය කිරීමකින්, ඇපයකින් හෝ වෙනත් බැඳීමකින් නැතහොත් කවර හෝ ගාස්තුවකින් හෝ හිමිකම් පෑමකින් නිදහස්ව නිසි බලධරයා වෙත සම්පූර්ණයෙන්ම සතුවිය යුතු ය ;

(ආ) රාජසන්තක කිරීමේ ආඥාවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කර ඇත්නම් අභියාචනයේ අවසාන තීරණය ලැබුණු විට නිදහස්ව නිසි බලධරයා වෙත සම්පූර්ණයෙන්ම සතු විය යුතු ය :

එසේ වුවද යම් වරදක් සිදුවූයේ තමාගේ අනුදැනුම නොමැතිව බවට සහ ඒ වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවට යම් තැනැත්තකු ඔප්පු කරන්නේ නම්, ඔහු එම වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

පුද්ගල මණ්ඩල වලින් සිදුකරනු ලබන වැරදි.

**8.** මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන විට,-

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් වන අවස්ථාවක ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තෙක්ම ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය සමාගමක් වන අවස්ථාවක, ඒ සමාගමේ සෑම හවුල්කරුවකු ම,

ඒ වරද සිදුකරනු ලැබුවේ තමාගේ කැමැත්ත හෝ සහයෝගය නොමැතිව බවටත් තම කාර්යවල ස්වභාවය සැලකිල්ලට ගෙන සහ සියලු අවස්ථානුගත කරුණුවල දී තමා විසින් ක්‍රියා කළ යුතුව තිබූ පරිදි ඒ වරද සිදුකිරීම වැළැක්වීම සඳහා නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බවටත් ඔහු ඔප්පු කරන්නේ නම් මිස, ඔහු වරදකට වරදකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග.

**9.** (1) මේ පනතේ ප්‍රතිපත්ති හෝ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා හෝ මේ පනත මගින් නියම කිරීමට නියමිත කරුණු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) එවැනි සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරන දින සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) එවැනි සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු නොලබන එවැනි යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(4) නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**10.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.